**01**

# පැරණි ලක්දිව නීති ක්‍රමය ම්ලේච්ඡ ස්වරූපයක් ගත්තක් ද? නැතහොත් ජනසම්මතවාදී සාධාරණ වූවක් ද?

(අනුරාධපුර යුගයේ නීති ක්‍රමය සම්බන්ධයෙන් ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්)

පී.මංජුලා උදය කුමාරි ප්‍රේමරත්න

**සංක්ෂේපය**

ලාංකේය දේශපාලන සන්දර්භය තුළ නීතියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඕනෑ ම රටක සාමය, සදාචාරය, යහපැවැත්ම පවත්වාගෙන යාම උදෙසාත්, එක් පාර්ශවයකගේ අයිතීන් සහ අනෙක් පාර්ශවයේ යුතුකම් සහතික කිරීම සඳහාත් අවැසි නීති ක්‍රමයක් පැවතීම අත්‍යවශ්‍ය කරුණකක් වේ. ඒ අනුව නීති මූල කීපයක් ඔස්සේ හැඩගැසුණු යම් ආකාරයක නෛතික රාමුවක් තුළ රටේ රජතුමා යුක්තිය ඉටු කරන ලදී. නමුත් රජු නීතියේ උල්පත ලෙස නොසැලකූ අතර රජුට වුව නීතිය ඉදිරියේ හිස නැමීමට සිදු වූයේ ය.

මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වූයේ පැරණි ලක්දිව නීති ක්‍රමය ම්ලේච්ඡ ස්වරූපයක් ගත්තක් බවට ඇතැම් ලේඛකයන් අතර පවතින මතය සත්‍යයක්දැයි විමර්ශනශීලී ව අධ්‍යයනය කිරීම යි. එය එසේ නොවේ නම් මෙරට පැවති නීති ක්‍රමය ජනසම්මතවාදී සාධාරණ එකක් ද යන්නත් අධ්‍යයනය කිරීම තවත් අරමුණකි.

එහිදී පළමු කී දුර්මතය ඇතිවීමට තුඩුදුන් සාධක හඳුනාගත හැකි වූ අතර පසුකාලීන ව දක්නට ලැබෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ඇහැලේපොළ කුටුම්භයේ වූවන්ට දඬුවම් දුන් අකාරය වැනි විරල සිදුවීම් එවන් මතයක් ඇතිවීමට හේතු වූ බව උපකල්පනය කළ හැකි වී ය. මෙරට පැරණි නීති ක්‍රමය ජනසම්මතවාදී සාධාරණ වූවක්දැයි සොයා බැලීමේදී එකල පැවති සාපරාධී ක්‍රියා සහ ඒවාට දුන් දණ්ඩන පටිපාටිය, යුක්තිය පසිඳලූ ආකාරය යනාදිය සම්බන්ධයෙන් මූලාශ්‍රයෙහි එන තොරතුරු එකී ගැටලුවට පිළිතුරු සපයයි ය. එනම් යමෙක් කළ වරදකට දුන් දඬුවම සකස් වූයේ කලක් පුරා පැවතෙමින් ආ ජනසම්මත වූ චාරිත්‍රවලට අනුකූලව යි. මෙවැනි ජනසම්මතවාදී මූලධර්මයන්ට පටහැනි ව ක්‍රියා කිරීමට රජුට වුව නොහැකි වූයේ ය.

පර්යේෂණ ක්‍රමවේදය වූයේ ප්‍රාථමික මූලාශ්‍රය සියුම් ලෙස පරීක්ෂා කරමින් අවශ්‍ය දත්ත රැස් කිරීම යි. ඒ හැරුණුවිට ද්වීතීයික මූලාශ්‍රය ද පරිශීලනය කෙරුණි.
මෙහිදී එළඹෙන ලද නිගමනය නම් , පැරණි ශ්‍රී ලංකාවේ පැවති නීතිය බොහෝ දුරට සාධාරණ වූවක් බව යි. එනම්, යම් වරදකට දඬුවම් දුන්නේ තරාතිරම, පක්ෂපාතීත්වය මත නොව, වරදේ ස්වරූපයට හා ප්‍රමාණයට අනුව ය. විශේෂයෙන් ම මෙරට පාලකයන් නීතිය ක්‍රියාවට නැංවූයේ පළිගැනීමේ චේතනාවෙන් නොව, ජනතාව යහමගට ගැනීමේ අරමුණෙනි. ඒ අනුව එකල පැවති නීති ක්‍රමය මෙරට ජනතාව සදාචාර සම්පන්න, යුක්තිගරුක පිරිසක් බවට පත් කිරීමට හේතු වූ බව නිගමනය කළ හැකි ය.
**ප්‍රමුඛ පද** : අනුරාධපුර යුගය, නීතිය, නීතිමූල
ලාංකේය දේශපාලන සන්දර්භය තුළට නීතිය නමැති සංකල්පය ප්‍රවේශ වූයේ යුරෝපීයයන්ගේ ආගමනයෙන් පසු ව යැයි ඇතැමුන්ගේ මතය යි. එහෙත් මීට පෙර සිට ම මෙරට කිසියම් වූ නීති පද්ධතියක් පැවති බව පෙනේ. එකී නීති ක්‍රමය මෙරට ජනතාව සදාචාර සම්පන්න, යුක්තිගරුක පිරිසක් බවට පත් කිරීමට හේතු වූයේ ය. මෙම අධ්‍යයනයේදී විමර්ශනයට භාජනය කෙරුණේ මෙරට පැවති නීති ක්‍රමය ම්ලේච්ඡ ස්වරූපයක් ගත්තක් බවට ඇති මතය පිළිබඳ ව යි. සත්‍ය වශයෙන් ම මෙරට නීතිය කලක් පුරා පැවතෙමින් ආ ජනසම්මත වූ සාධාරණ වූවක් බව මෙම ලිපිය තුළින් ඉදිරිපත් කෙරේ.
ඕනෑ ම රටක නීතිය සකස්වීමේ පදනම වන්නේ නීති මූලාශ්‍රය යි. ඒ අනුව පැරණි ශ්‍රී ලංකාවේ නීතිය සකස්වූයේ ද නීති මූලාශ්‍රය අනුව ය. චාරිත්‍ර, ධර්ම, ව්‍යවහාර, රාජශාසන යන නීති මූල කිහිපය ඔස්සේ හැඩගැසුණු නෛතික රාමුවක් තුළ වෙසෙමින් රජතුමා යුක්තිය ඉටු කරන ලදී. මෙවැනි තත්ත්වයක් පැරණි ශ්‍රී ලංකාවේ පැවතිය ද ඇතැම් බටහිර ලේඛකයන්ගේ මතය වන්නේ අපේ පැරණි නීතිය ම්ලේච්ඡ වූවක්, ක්‍රෑර වූවක් බව යි. සීඝ්‍ර සමාජ වෙනස්වීම් සහ චල්‍යතාවන් පෙන්නුම් කරන 17, 18, 19 සියවස්වල උඩරට සමාජයේ කුල හා සමාජ නීතිරීති හා දඬුවම් ක්‍රමවල දැඩි මුහුණුවර ඔවුන් නොමග යාමට ප්‍රධාන හේතුවකි. මේ ඔවුන්ගේ අදහස් කිහිපයකි.

★ රටවැසියන්ට කෲර දඬුවම් දුන් බව.(රූබේරු, ටී.කේ., 2003, පි.122)

★ හැම විට ම රජුගේ තීරණය අවසාන තීරණය යි.(සෝමරත්න, එච්.ඇම්., 2002, පි.170)

★ නීතිය රජුගේ කැමැත්ත යි. රජුගේ හිතුමතය හැර වෙන නීතියක් එහි නැති බව,රජුගේ කෲර බව තේරුමක් ඇතුවත් නැතිවත් ලේ වැගිරවීමෙන් ප්‍රත්‍යක්ෂය.(කරුණාරත්න, ඩේවිඩ්, 2003, පි.292)

නමුත් සත්‍ය ඉතිහාසය වටහා ගැනීමේදී මොවුන්ගේ කෘතීන්හි සීමිතතා සිහි තබාගත යුතු ය. විශේෂයෙන් ම ඇතැම් කරුණුවල විශ්වසනීයත්වය අතිශයින් ම සැක සහිත ය. ඩොයිලි, සයිමන් සෝවර්ස්, ආමර් වැනි අයගෙන් ද යම් ප්‍රමාණයකට මෙබඳු විවේචන එල්ල වී තිබේ. පාරම්පරික දේශීය නීතිය හා අධිකරණ ක්‍රමය බ්‍රිතාන්‍ය නීතිය හා අධිකරණය සමග සැසඳීමේදී, ලක්දිව නීතිය අමානුෂික, පුද්ගල නිදහසට බාධා කරන, කෲර එකක් ලෙස හඳුන්වා දීමේ වෑයමක් එම කෘතිවලින් පෙනේ. බ්‍රිතාන්‍යයන් මෙරටට හඳුන්වා දෙන ලද ඉංග්‍රීසි නීතියේ සර්ව සාධාරණ බව මතුකර දැක්වීම මෙම ප්‍රයත්නයේ එක් අරමුණකි. ඇතැම්විට ඔවුන් මුහුණදුන් පුද්ගලික අත්දැකීම් එම විශ්ලේෂණවල පදනම වන්නට ඇත. ඊට ප්‍රබල සාධකයක් වන්නේ නොක්ස්ගේ විචාරය යි. එසේ ම සාරධර්ම රක්‍ෂණය උදෙසා මෙකල විවිධ ආගමික තේමාවන් යටතේ රචනා කරනු ලැබූ "දෙතිස් වධ" වැනි දඬුවම් පිළිබඳ අතිශයෝක්තිමය විවරණ සැබෑ භාවිතාවන් ලෙස මෙම ලේඛකයන් හඳුනා ගැනීම ද මෙයට එක් හේතුවකි. නමුත් මේවා සැබෑ භාවිතාවන් ලෙස පිළිගැනීමට ඇති සාක්ෂි අතිශයින් දුලබ ය. (ගමගේ, ගුණසේන, 2008, පි.122)

එසේ ම මූලාශ්‍රය විමර්ශනය කිරීමේදී පෙනීයන වැදගත් කාරණයක් වන්නේ මෙම ලේඛකයන් මෙවැනි මත ඉදිරිපත් කර තිබෙන්නේ ලාංකේය දේශපාලන සන්දර්භය තුළ ඇතැම් පාලකයන් කටයුතු කළ ආකාරය පදනම් කරගෙන බව යි.
ධාතුසේන රජතුමා සිය නැඟණියට දුන් දඬුවම්
කාශ්‍යප කුමරු සිය පියාට දුන් දඬුවම්

ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ඇහැළේපොළ කුටුම්භයේ වූවන්ට දුන් දඬුවම්

යනාදිය ඊට මනා නිදර්ශන ය. නමුත් මේවා මෙරට නීතියේ කිසිදු දිනෙක අනුමත නොවූ දණ්ඩන ක්‍රමයන් ය. ලංකා ඉතිහාසයේ මෙසේ අත්තනෝමතික ලෙස කටයුතු කළ පාලකයෝ දක්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. මෙවැනි විරල අවස්ථා පදනම් කරගෙන පැරණි ශ්‍රී

ලංකාවේ නීතිය ම්ලේච්ඡ ස්වරූපයක් දැරූ බව පැවසීම යුක්තියුක්ත නොවේ. මහින්දාගමනයෙන් අනතුරු ව මෙරට රාජ්‍යාගම බවට පත්වූයේ බුද්ධාගම යි. එසේ ම රටේ පාලකයා බවට පත්වීමට නීතියෙන් හිමිකම ලැබුණේ බෞද්ධයෙකුට ය. එසේ පත්වන පාලකයන් රටේ පාලන කටයුතු ගෙනයාමේදී නීතිය ක්‍රියාවට නැංවූයේත් බෞද්ධාගමට අනුකූල ව යි. එසේ නොවුණේනම් එම පාලකයාට රජය නිරවුල් ව ගෙන යා නොහැකි වූයේ ය.

එසේ ම මෙරට බලයට පත්වන පාලකයා පෙර සිරිත රැකීමට නිරතුරු ඇපකැප වී සිටියේ ය. ඒ අනුව පැරණි ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය ම්ලේච්ඡ ස්වරූපයක් දැරූවක් නොවන බව පෙනේ. පූර්ව යටත් විජිත දිගු ඉතිහාසය තුළ මෙරට නීතියේ භාවිතයන්, දඬුවම් හා යුක්තිය පසිඳලීම විධිමත් හා සාධාරණ ක්‍රියාවලියක් වීම එයට හේතුව යි. ඒ බව හේතු සාධක කිහිපයක් ඔස්සේ පෙන්වාදිය හැකි ය.

පැරණි රජවරුන් විසින් පනවන ලද ඇතැම් නෛතික ආඥා
රජවරු නීතිය සම්බන්ධයෙන් අනුගමනය කළ ඇතැම් ප්‍රතිපත්ති
දඬුවම් ක්‍රියාත්මක කළ ආකාරය යුක්තිය පසිඳලූ ආකාරය

රජවරු පැනවූ නෛතික ආඥා අතර මාඝාත ආඥාව ඉතා වැදගත් වේ. ලංකා ඉතිහාසය විමර්ශනය කර බැලූවිට අපේ පැරණි රජවරු කිහිපදෙනෙක් ම පාහේ මෙම ආඥාව පනවා තිබෙන බව පෙනේ. මාඝාත ආඥාව වූ කලී බුදුදහමේ ඉගැන්වෙන අවිහිංසාවාදී ප්‍රතිපත්තිය මුල්කර ගත්තකි. ඒ අනුව මේ සඳහා පදනම සපයා ඇත්තේ බුදුදහම යි.

මාඝාත ආඥාව ප්‍රථම වරට පැනවූ රජු ලෙස ඉතිහාසගත වන්නේ ආමණ්ඩගාමිණී අභය (ක්‍රි.ව.79-.89) රජතුමා ය. (මහාවංසය, 1996, 35:07, පි.136) වෝහාරිකතිස්ස රජතුමා (ක්‍රි.ව.269.291) හිංසාවෙන් තොර වූ නීති ක්‍රමයක් මෙරට ඇති කළේ ය. (ම.ව., 36:28, පි.143) සිලාකාල රජු (ක්‍රි.ව.524.537) "ලක්දිව කිසි සතෙක් නොනසා ව" යන ව්‍යවස්ථාව කරවී ය. (ම.ව., 40:30, පි.20) එසේ ම තුන්වන කාශ්‍යප රජු ද (ක්‍රි. ව. 524.537) "සතුන් නොමරව්" යන ආඥාව කරවූ බව මහාවංසයේ සඳහන් වේ. (ම.ව., 46:24, පි.46)

එපමණක් ද නොව, අප රජවරු සත්ත්ව හිංසනය නීතියෙන් තහනම් කර තිබූ බවට ද සාධක තිබේ. පස්වන අග්බෝ රජු ( ක්‍රි.ව.718.724) පොහොය දිනයන්හි මත්ස්‍ය, මාංශ සහ සුරා ආදිය තමන්ගේ ඇතුළ

නුවරට ගෙන ඒම වැළැක්වූ බවට එන මහාවංස සඳහන (ම.ව., 47:48, පි.55) ඊට මනා නිදර්ශනයකි. මේ හැරුණුවිට ඇතැම් රජවරු වැව්වල මාලු ඇල්ලීම පවා නීතියෙන් තහනම් කර තිබේ. පළමුවන සේන රජු (ක්‍රි.ව.833-.853) මත්ස්‍යයන්ට, සිව්පාවුන්ට සහ පක්ෂීන්ට සැප පහසුකම් සලසා ඇති අතර (ම.ව., 2004, 50:4, පි.225) තුන්වන කාශ්‍යප රජු (ක්‍රි.ව., 730.733) තොටුපළවල් ද්විත්වයක මත්ස්‍යයන් ඇතිකොට තිබේ. (ම.ව.,2004, 48.24, පි.212)

පැරණි ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය සාධාරණ වූවක් වීමට රජවරුන් විසින් පනවන ලද නෛතික ආඥා හේතුවූවාක් මෙන් ම රජවරුන් විසින් නීතිය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ඇතැම් ප්‍රතිපත්ති ද ඒ සඳහා උපස්ථම්භක වූයේ ය. ඒ අනුව ධර්මානුකූල ව නෛතික කටයුතු පවත්වාගෙන යමින් රට පාලනය කිරීම ඉතා වැදගත් වේ.

විජය සම්බන්ධ කතා ප්‍රවෘත්තියේදී මහාවංසය සඳහන් කරන්නේ විජය දැහැමෙන් අනුශාසනා කළ බව යි. "ධම්මේන සමේන" (ම.ව., 7:74, පි.36) එහෙත් මහාවංසටීකාව වන වංසත්ථප්පකාසිනියේ එන කරුණු දෙස විමර්ශනශීලී ව බලනවිට පෙනී යන්නේ විජය රාජ ධර්මයට අනුකූල ව, සාධාරණ ව, චෝර උපද්‍රව විරහිත ව අර්ථයෙන් අනුශාසනා කළ බව යි.

"ධම්මේන සමෙන ති රාජ ධම්මේන සමෙනා ති දානාදිනා සංගහකරණ වසෙන ජනස්ස සමාන කාරණේන ති අත්ථො.අඛිලංති චොරකණ්ටක රහිතං"(වංසත්ථප්පකාසිනි, 2001, පි.199)

මෙසේ අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කළ බව වංසකතාවන්හි නිරන්තරයෙන් සඳහන් වන්නකි. ඒ අනුව රට පාලනය කිරීම ජනතාව ද අපේක්ෂා කළේ ය. නමුත් අර්ථයෙන් අනුශාසනා කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න මේවායේ සඳහන් නොවේ. මෙයට මනා පිළිතුරක් අටදාසන්නයෙන් අනාවරණය කරගත හැකි ය. එහි සඳහන් වන පරිදි අර්ථයෙන් අනුශාසනා කිරීම යනු රජු අධිකරණයෙහි හිඳිමින් නිවැරදි ව යුක්තිය ඉටු කිරීම යි. (අටදාසන්නය, 1954, පි.15) එහි ම තවත් ස්ථානයක "වොහාර මනුසාසන්තො" යනුවෙන් විනිශ්චය ආසනයේ හිඳ රාජ කර්මාන්තයන් අනුශාසනා කිරීම හෙවත් යුක්ති බිණීම යනුවෙන් විස්තර කර තිබේ. (අටදාසන්නය, 1954, පි.54)

ශ්‍රී ලංකාවේ පරම්පරාගත ඉතිහාසය ආරම්භ වන්නේ විජය රජතුමාගෙනි. මෙම ප්‍රවෘත්තියට අනුව ස්ඵුට වන්නේ විජයගේ සිට ම ධාර්මික නීති ක්‍රමයක් මෙහි ක්‍රියාත්මක වූ බව යි. එමෙන් ම සේන ගුත්තික දෙදෙනාගේ රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් මහාවංස කතුවරයා දක්වන්නේ, "රජ්ජං ධම්මේන කාරයුං" යනුවෙනි. (ම.ව., 21:10--.11, පි. 89) මහාවංසටීකාව මෙය පැහැදිලිකොට ඇත්තේ චාරිත්‍ර, ධර්ම විනිශ්චය පිළිබඳ ප්‍රවේණි ධර්ම නොයික්මවා රජ කළ බව යි.

"ධම්මේන කාරයිං ති චාරිත්ත ධම්මේන විනිශ්චය පවෙණි ධම්මං අනතික්කමෙන රජ්ජං කාරෙයුං ති අත්ථො"(වංසත්ථප්පකාසිනී, පි.331)

එසේ ම විජාතිකයෙක් වුව ද එළාරත් මධ්‍යස්ථ ව, ධාර්මික ව විනිශ්චය කටයුතු කළ බව මහාවංසය සඳහන් කරයි. (ම.ව., 21:14, පි.89) කුඩා අග්බෝ රජු ධර්මයෙන් විනිශ්චය කරමින් මිථ්‍යාධිකරණ නඟන්නන් ශූන්‍යකොට තිබේ. (ම.ව., 46:71--, පි.48) මේ අනුව අනුරාධපුර නීති ක්‍රමය ගත්විට සජාතික පාලකයෙක් වුවත් විජාතික පාලකයෙක් වුවත් ධාර්මික ව විනිශ්චය කටයුතු කළ බව පැහැදිලි වන අතර ඇතැම්විට එසේ කටයුතු කිරීමට පාලකයන්ට සිදුවන්නට ඇත.

එසේ ම සතර අගතියෙන් තොර ව නෛතික කටයුතු සිදුකිරීමත් පැරණි නීතියේ පැවති ප්‍රධාන ලක්‍ෂණයකි. සතර අගති යනුවෙන් සඳහන් වන්නේ ඡන්දය, ද්වේෂය, භය, මෝහය යන කරුණු සතර යි. බෞද්ධ රජවරු මෙකී ක්‍රියාමාර්ගය අනුගමනය කිරීම ස්වභාවික ය. බුද්ධදාස රජු (ක්‍රි.ව. 337.365) දශරාජ ධර්මයෙන් යුක්ත ව සතර අගති හැර සිව් සඟරාවතින් ජනයාට සංග්‍රහ කළ බව මහාවංසයේ සඳහන් වේ. (ම.ව., 37:108--, පි.3) එසේ ම කුඩා අග්බෝ රජු ද (ක්‍රි.ව. 604.614) සතර අගතීන්ගෙන් තොර ව සතර සංග්‍රහ වස්තුවෙන් යුක්ත ව රට පාලනය කොට තිබේ. (ම.ව., 46:71--, 51:43 පි.) මෙසේ සතර අගතීන්ගෙන් වෙන් ව නෛතික කටයුතු සිදුකිරීම සජාතික පාලකයන්ට මෙන් ම විජාතික පාලකයන්ට ද පොදු කාරණයක් විය. එළාර රජු ඡන්දයෙන් හෝ ද්වේෂයෙන් අගතියට නොගොස් නඩු විසඳූ බවට එන මහාවංස සඳහන (ම.ව., 21:41--, 32.34 පි.) ඊට හොඳ ම නිදර්ශනයකි.

"අගතිගමනදොසා මුත්තමත්තෙන එසො"(ඌනපූරණසහිතො මහාවංසො, 1959, 21:34, පි.113)

නීතිය ක්‍රියාවට නැංවීමේදී මෙවැනි අදහස් ඇතිවූයේ බුදුදහමේ ආභාසය ලැබුණු නිසා ය. සදාචාර සම්පන්න, යුක්තිගරුක නීති ක්‍රමයක් පැරණි ශ්‍රී ලංකාවේ ඇතිවීම කෙරෙහි බුදුදහමේ ආභාසය බෙහෙවින් ඉවහල් වූවා මෙන් ම බොහෝ නීතිරීති බෞද්ධ පරිසරයකට සරිලන ආකාරයට සකස්වූයේ ය. නීති නිසණ්ඩුව පවා සඳහන් කරන්නේ සිංහල නීතිය සකස්වූයේ බෞද්ධ සිද්ධාන්ත පදනම් කරගෙන බව යි.

පැරණි ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය ම්ලේච්ඡ ස්වරූපයක් දරන බවට බොහෝ ලේඛකයන් මත ඉදිරිපත් කර තිබෙන්නේ පැරණි නීතිය යටතේ පැවති දඬුවම් ක්‍රම නිසා ය. සැබැවින් ම කොණ්ඩවටවන ලිපිය (E.Z.,Vol.V, p.136), වේවැල්කැටිය ලිපිය (E.Z.,Vol.1, p.245) වැනි අභිලේඛන මූලාශ්‍රය විමර්ශනය කිරීමෙන් ඇතැම් වැරදි සඳහා දැඩි දඬුවම් පමුණුවා ඇති බව පැහැදිලි වේ. මෙවැනි ව්‍යවස්ථා පනවා තිබීම තුළින් මිනිසුන් තුළ අපරාධ ඇති කිරීමට භීතියක් ඇති කරවීමට උත්සාහ ගන්නට ඇත. නමුත් මෙවැනි ව්‍යවස්ථා නිසා ම මෙරට නීතිය ම්ලේච්ඡ එකක් බව පැවසිය නොහැකි ය.

කෙසේ වෙතත් නීතියක් බලාත්මක වීමට නම් දඬුවමක් අවශ්‍ය වේ. නමුත් පැරණි නීතිය යටතේ දඬුවම් ලබා දුන්නේ වරදේ ස්වභාවයට හා වරදේ ස්වරූපයට අනුව යි. ශ්‍රී රාහුල හිමියන්ගේ කාව්‍ය ශේඛරයේ,

"වරද කළවුන් හට
ගිවිස්වා ඇති පමණට
කරවන නිගාවට
සඟහ සරිකොට කියත් පෙරසිට" (කාව්‍යශේඛරය, 1997, පි.38)

මෙම මූලාශ්‍රය පසුකාලීන මූලාශ්‍රය වුව ද අනුරාධපුර යුගයේදීත් එකී ප්‍රතිපත්ති නොතිබුණා යැයි කිව නොහැකි ය. මෙසේ වරදේ ප්‍රමාණයට දඬුවම් දුන්නාක් මිස පුද්ගලික වෛරය නිසා හෝ පක්ෂපාතීත්වය මත දඬුවමේ ප්‍රමාණය වෙනස් නොවුණි. පුද්ගලික වෛරය මත දඬුවම් පැමිණවූ අවස්ථා ලංකා ඉතිහාසයේ දක්නට ලැබෙන්නේ ඉතාමත් විරල වශයෙනි. නමුත් මේවා පොදු කරුණු නොවේ. රජතුමා තමාගේ පෞද්ගලික හිතවාදීකම් අමතකකොට නීතියටත්, සාධාරණ විනිශ්චයකටත් අවනත වූ අවස්ථාවක් මහාවංසයේ සඳහන් වේ. එනම් අන්තිම වත්ථු චෝදනාව ලැබූ තිස්ස නමැති භික්ෂුව රජු අකමැති වුවත්

විනිශ්චයට අනුව සිවුරු හරවා ශාසනයෙන් බැහැර කරන ලදී. (ම.ව., 37:38, පි.149) මෙයට විරෝධය පළකිරීමට රජුට නොහැකි විය.

එදා නීතිය යටතේ ඇතැම් අවස්ථාවලදී අපරාධකරුවන්ගේ දඬුවම් ලිහිල් කළ සහ අපරාධකරුවන්ට අභය දානය දුන් අවස්ථා පිළිබඳ මූලාශ්‍රයෙන් තොරතුරු අනාවරණය වේ. සිරිසඟබෝ රජතුමා (ක්‍රි.ව., 247.249) මරණ දඬුවමට සුදුසු වූ අපරාධකරුවන් රහසින් පළවා හැර ඒ වෙනුවට මෘත ශරීර ගෙන්වා දවාලූ පුවතක් මහාවංසයේ දැන්වේ. (ම.ව., 36:79.81, පි.145) මේ මගින් රජුගේ ප්‍රමාණාතික්‍රාන්ත වූ රාජ්‍ය ප්‍රතිපත්තිය පෙන්වයි. කිත්සිරිමේඝ රජු ද (ක්‍රි.ව.301.328) මහින්දාගමන උත්සවයේදී සිරකරුවන් නිදහස් කර තිබේ. (ම.ව., 37:72, පි.02) මහාදාඨික මහානාග රජු යදම්, රැහැන්, හැකිලි, සිරමැදිරි ආදී සියලු බන්ධනයෙන් අපරාධකරුවන් මුදවී ය. (ම.ව., 34.85, පි.148)

වරදකරුවන් නැවත යහමගට ගැනීම මෙම සමා ප්‍රදානයන්ගේ උසස් අරමුණ වන්නට ඇත. මෙසේ අපරාධකරුවන්ට අභය දානය දීමෙන් සමාජයේ අපරාධ උග්‍ර වේ යැයි ඇතැමෙකුගේ මතය වන්නට පිළිවන. නමුත් අප නරපතියන් ඔවුන් අපරාධකරුවන්ගේ තත්ත්වයට පත්වීමට බලපෑ හේතු සාධක විමසා, නිසි අවවාද දී ඔවුන් යහමගට ගැනීමට සමත්කම් දක්වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

"සොරුන් ගෙන්වා මතු මෙබන්දක් නොකරවයි අවවාද කියා" (රාජරත්නාකරය, 1995, පි.81)

එසේ ම එක්වරක් දඬුවම් කරනු ලැබූ වරදකට නැවත වතාවක් දඬුවම් කිරීමට පැරණි නීතියෙන් අවසර නොවුණි. පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ, "එය පැට්වූ වරදට් වටාලා දඩ් නොගන්නා ඉසා"(E.Z.,Vol.I, p. 44)

යනුවෙන් අවධාරණය කරයි. යමෙක් වරදක් කළවිට අත්අඩංගුවට ගත හැකි වූයේ අදාළ වැරදිකරුවා පමණි. කෙනෙකු කළ වරදකට අඹු දරුවන් වන්දි ගෙවිය යුතු වූයේ නැත.

"දඩට ස්වාමිගිනුත් මිස අඹුදරුවන් වැළැක්මෙ නොගන්නා ඉසා (E.Z.,Vol.III, pp. 75-78)

යන ශිලාලේඛන පාඨය එයට මනා නිදර්ශනයකි. මේවායින් පැහැදිලි වන්නේ සාධාරණ දණ්ඩන පටිපාටියක් එකල පැවති බව යි. එසේ ම මේ සියලු සාක්ෂි මගින් තහවුරු වන්නේ බොහෝ රජවරුන් සිය රාජ්‍ය ප්‍රතිපත්ති තුළ වැරදිකරුවන්ට දඬුවම් දීමේදී හැකි සෑම විට ම ලිහිල්, නම්‍යශීලී, සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට උනන්දු වූ බව යි. අපරාධකරුවන්ට දඬුවම් ලබා දුන්නේ ඔවුන් යහමාර්ගයට ගැනීම සඳහා යි. වර්තමාන නීති දර්ශනය අනුව දඬුවම් ලබාදීමේ මුඛ්‍ය පරමාර්ථ දෙකක් තිබේ.

යම් වරදක් සිදුවුණා නම් එවැනි වැරදි තව දුරටත් සිදුවීම වැළැක්වීම

වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම

එමගින් අපේක්ෂිත ය. (මනම්පේරි, පී, 1988, පි.134) විශේෂයෙන් ම දඬුවම් ලබාදුන්නේ පුද්ගලයා විනාශ කිරීමට නොව, ඔවුන් සකස්කර ගැනීමට ය. එසේ නැතහොත් මෙහි අධ්‍යාශය වූයේ පුද්ගලයා ආයති සංවරයේ පිහිටුවීම ය. මෙහිදී නිශ්ශංකමල්ල රජු විසින් කර ඇති ප්‍රකාශයක් ඉතා වැදගත් වේ.

"රජදරුවෝ වරදට සුදුසු නිග්‍රහ කරන්නාහු ශරීරයේ රෝගයකට වෙදහු කරන පිළියමක් මෙන් හිත සිතින් කරන්නාහ."(E.Z.,Vol.II, p. 108)

නීතිය හා දඬුවම පිළිබඳ පැවති උසස් පරමාදර්ශය කුමක්දැයි මෙයන් සිතාගත හැකි ය. මේ සංකල්ප ඔහුට ලැබුණේ පුරාණ රාජධර්මවලට හා යුක්තිධර්මවලට අනුකූල ව යි. අනුරාධපුර යුගයේ පාලකයන්ගේ අභිලාශය වන්නට ඇත්තේ ද මෙය යි. මෙසේ අවධාරණය කිරීමෙන් දඬුවම් දීමේ පැරණි සමාජ දර්ශනය කුමක්දැයි මැනවින් සනාථ කරයි. මිනිසාගේ හැසිරීම් තුළින් සමාජයට වන විවිධාකාරයේ හානි වළක්වා ගැනීම සඳහා දඬුවම් ක්‍රියාත්මක කරන්නට ඇත. නමුත් එපමණකින් පැරණි ශ්‍රී ලාංකේය නීති ක්‍රමය ම්ලේච්ඡ එකක් බව සැලකීම සාධාරණ නොවන බව පැහැදිලි ය.

යුක්තිය පසිඳලූ අකාරය ගත් කල අප නරපතියන් මධ්‍යස්ථ ව යුක්තිය ඉටු කළ බවට සාධක මූලාශ්‍රයෙන් ලැබේ. එසේ ම පැරණි නීතිය යටතේ තමාට අසාධාරණ නඩු තීන්දුවක් ලැබුණොත් ඒ පිළිබඳ රජුට ආයාචනා කිරීමට ඕනෑ ම කෙනෙකුට අවස්ථාව තිබිණි. සද්ධම්මප්පකාසිනියට

අනුව පහළ උසාවියකින් පැනවූ දඬුවමකට විරුද්ධ ව ඉදිරිපත් කෙරුණු අභියාචනා රජු විසින් නැවත විභාගකොට තිබේ. (සද්ධම්මප්පකාසිනී, 1927, පි.18) එමෙන් ම භාතිය රජුගේ කාලයේදී පහළ උසාවියකින් දුන් නඩු තීන්දුවක් අසාධාරණ යැයි රජුට කන්නලවු කළ විට රජු එම අභියාචනය එදා හිරු බැස යන තුරුත් විභාග කළ බව වංසත්ථප්පකාසිනියේ සඳහන් වේ. (වංසත්ථප්පකාසිනි, පි.506 )

මෙසේ අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ජනතාවට ලබාදී තිබූ බව මජ්ඣිම නිකා අටුවා පාඨයක ඉතා ප්‍රශස්ථ ව දැක්වේ. ජනපදයක යම් ගැටලුවක් ඉස්මතු වූ විට එයට නිසි විනිශ්චයක් ගම් ලද්දාගෙන් නොලැබුණොත් එය ජනපද භෝජකයා කරා ද, ඔහුගෙන් ද නිවැරදි විනිශ්චයක් නොලැබුණ විට මහාවිනිශ්චය මහාමාත්‍යයා කරා ද, ඔහුටත් සාර්ථක පියවරක් ගත නොහැකි වූයේ නම් සේනාපතියා කරා ද, අවසානයේ රජු දක්වා ද අභියාචනා කළහැකි බව එය විමර්ශනශීලී ව අධ්‍යයනය කිරීමෙන් මනා ව පැහැදිලි වේ. (මජ්ඣිම නිකාය අටුවාව, 1998, පි.728)

මෙසේ පැරණි නීතිය තුළ පුද්ගලයාට සහන සැලසූ බවට සාධක තිබේ. එසේ ම අනුරාධපුර නීති ක්‍රමය යටතේ රජු නීතියේ උල්පත ලෙස නොසැලකූ බව කිව හැකි ය. එයට හේතුව රජු හැකි සෑම විටෙක ම පාහේ පූර්ව චාරිත්‍රයට ගරු කළ හෙයිනි. පෙර සිරිත් යන්නෙන් අදහස් කෙරුණේ අතීතයේ සිට පැවත ආ පෞරාණික ප්‍රතිපත්තීන් ය. වල්පොළ රාහුල හිමියන් සඳහන් කරන්නේ පුරාණ කාලයේදී පරම්පරානුගත සදාචාරය රටෙහි සම්මත නීතියේ කොටසක් වූ බවත් ඒවා ආගමික හා නෛතික විධිවිධානයන් ලෙස දෙකක් නොව, එකක් ලෙස රටෙහි පවතින නීතියේ කොටසක් බවට පත්වූ බවත් ය. (රාහුල හිමි, වල්පොළ, 1962 , පි.95) ඒ අනුව කාලයක් පුරා රටේ මුල් බැසගෙන තිබූ සිරිත් රටේ නීති බවට පත් වූ බව සිතිය හැකි ය. නමුත් සිරිත් බලාත්මක වීමට රාජාඥා මූලික විය.

රාජාඥාව යටතේ නව නීති පැනවීම සහ පැවති නීති විපර්යාසයන්ට බඳුන් කළ ද රජු හැකි සෑම විටෙක ම පාහේ පූර්ව චාරිත්‍රය ඉක්මවා නොයාමට වගබලා ගත්තේ ය. (Perera, L.S., 2003, p.331) ජනතාව රාජාඥා පිළිපැදීමට බැඳී සිටියේ ඒවා මානුෂික පදනමක් ගත්තේනම් පමණි. නෛතික අරුතින් කිවහොත් ස්වභාවික නීතියට

එකඟවන්නේනම් පමණි. පෙර සිරිත් ආරක්‍ෂා කිරීම රජවරුන්ගේ අනිවාර්ය යුතුකමක් ද විය. (විද්‍යාලංකාර, 2000, පි.37) පැරණි රජවරු පූර්ව චාරිත්‍ර ආරක්ෂා කළ බවට සාධක බොහොමයක් සාහිත්‍යමය මූලාශ්‍රයන්ගෙන් මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් ද අනාවරණය වේ. ඒ අතර බදුලු ටැම් ලිපිය පූර්ව චාරිත්‍ර රැසක් නීති බවට පත්වී ඇති බව අනාවරණය කරගැනීමට ඉඩ සලස්වයි. (E.Z., Vol.v, pp. 75-78)

මෙසේ රජවරුන් පෙරසිරිත් ආරක්ෂා කිරීම සමාජයේ ම අපේක්ෂාව වූයෙන් රජුට ම්ලේච්ඡ ලෙස, කෲර ලෙස නීතිය ක්‍රියාවට නැංවීම පහසු වූයේ නැත. එයට හේතුව නීතිය හා දඬුවම පිළිබඳ සම්මත සීමා බිඳ දැමීම රජුන් පවා මහජන විරෝධතාවන්ට ලක්වීමට සිදුවීම යි. තුන්වන උදය රජු (ක්‍රි.ව.935-.938) පෙර සිරිතට අනුව අභය භූමියක් ලෙස පිළිගෙන තිබූ තපෝවනයට ඇතුළු වී තමන්ටත්, යුවරජුටත් එරෙහි වූ ඇමතියන් සොයා ඔවුන් ව ඝාතනය කිරීම නිසා රජුට විරුද්ධ ව ජනතා විරෝධයන් එල්ල වූ බවට එන මහාවංස සඳහන (ම.ව., 52:27, 2004, පි.73) මීට මනා නිදර්ශනයකි. ඒ අනුව රජුට නැවත ජනතාවගේ ප්‍රසාදය ලබාගැනීමට හැකියාව ලැබුණේ පූර්ව රජවරුන් විසින් පවත්වන ලද චාරිත්‍ර කඩ නොකරන බවට ප්‍රතිඥා දීමෙන් අනතුරු ව යි.එමෙන් ම වරදේ සීමාවන් ඉක්මවා යන දඬුවම් පැමිණවීමට රජුන් පියවර ගැනීම චිර සම්මත චාරිත්‍රය ද ඉක්මවා යාමක් විය.

ඒ අනුව රජුගේ තීරණය ම අවසාන තීරණය නොවූ බව පෙනේ. දිගු කාලයක් භාවිතා වූ මූලධර්ම අනුව වැරදි නිවැරදි භාවිතාව තීරණය වූ හෙයින් අද මෙන් යුක්තිය හඳුනා ගැනීමට තර්කය වැනි උපාය මාර්ග අවශ්‍ය නොවී ය. තර්කය මත එළඹෙන නිගමන අයුක්ති සහගත වීමට ද ඉඩ ඇති බව නූතන අධිකරණ භාවිත සනාථ කරයි. කෙසේ වෙතත් පිළිගත් ක්‍රමය හැරදමා ක්‍රියාකළ ඇතැම් අවස්ථා ඓතිහාසික සාමාන්‍යකරණය බිඳදැමීමට සෑහෙන හේතුවක් ලෙස ගත නොහැකි ය.

සමස්තයක් වශයෙන් ගත්කල බුදුදහමින් හා පෙර සිරිතෙන් පෝෂණය වූ අනුරාධපුර නීති ක්‍රමය ජනසම්මතවාදී වූවක් බවත්, සාධාරණ වූවක් බවත් නිගමනය කළ හැකි ය. බටහිර ලේඛකයන්ගේ ප්‍රවාද මගින් ඓතිහාසික උපන්‍යාසය උල්ලංඝනය වේ යැයි තර්ක කිරීම අපහසු ය. එසේ ම අපේ නීතිය ම්ලේච්ඡ බවට, කෲර බවට මැසිවිලි නැගූ ඇතැම් බටහිර ලේඛකයන් විසින් ම සිංහල නීතිය සාධාරණ බවටත් කරුණු

ඉදිරිපත් කර තිබෙන බව ඔවුන් විසින් රචනා කර ඇති මූලාශ්‍රය විමර්ශනය කිරීමෙන් පැහැදිලි වේ. සිංහල නීතිය රටවාසීන්ගේ සමාජ තත්ත්වයට බෙහෙවින් ම ගැළපෙන බවත්, එය සෑහෙන තරම් නිර්දෝෂ හා මධ්‍යස්ථ ලෙස ක්‍රියාත්මක කළ බවත් ජෝන් ඩේවි එක් ස්ථානයක සඳහන් කරයි. (ඩේවි, පි.168) නොක්ස් සඳහන් කරන පරිදි සිංහලයන්ට පුරාතනයේ පටන් ම ආවේණික ව තිබෙන නීතිරීති අධිකරණය හමුවේ ක්‍රියාත්මක කිරීමෙන් යුක්ති ධර්මය විෂයෙහි ඉමහත් ප්‍රයෝජන ඇතිවේ. (කරුණාරත්න, පි.289) මෙසේ ඔවුන්ගේ ම ප්‍රකාශයන් තුළින් ම්ලේච්ඡ යැයි කී, කෲර යැයි කී ප්‍රකාශයන් නිෂ්ප්‍රභා වන අතර චිර සම්මත නීතියේ යුක්තියුක්ත භාවය නිසැකව ම පිළිගත් බව පැහැදිලි ය. ඒ අනුව අනුරාධපුර නීති ක්‍රමය ම්ලේච්ඡ ස්වරූපයක් දැරූවක් නොව, ජනසම්මතවාදී, සාධාරණ වූවක් බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

*අටදාසන්නය,* 1954, (සංස්කරණය), විමලකිත්ති ස්ථවිර, මැදඋයන්ගොඩ සහ සෝමින්ද ස්ථවිර, නෑහින්නේ, කොළඹ.

*ඌනපූරණසහිතො මහාවංසො,* 1959, (සංස්කරණය), බුද්ධදත්ත ථෙර, පොල්වත්තේ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*එදා හෙළදිව,* 2003, (අනුවාදය), කරුණාරත්න, ඩේවිඩ්, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*කාව්‍යශේඛරය,* 1997, (සංස්කරණය), ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*ඩේවි දුටු ලංකාව,* 2002, සෝමරත්න, එච්.ඇම්., විසිදුනු ප්‍රකාශන.

*නීති නිඝණ්ඩුව,* 1988, (සංස්කරණය), විජයතුංග, හරිස්චන්ද්‍ර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*ප්‍රතිකාල් ජාතික රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය,* 2003, (පරිවර්තනය), රුබේරු, ටී.කේ., ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මහාවංසය,* 1996, (සංස්කරණය), ශ්‍රී සුමංගල නාහිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

*මහාවංසය,*2004, (සංස්කරණය), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවංසො,* 2006, (සංස්කරණය), ඉලංගසිංහ, මංගල, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මජ්ඣිම නිකාය අටුවාව,* 1998, (සංස්කරණය), සොයිසා ද, ඒ.පී., කොළඹ.

*රාජරත්නාකරය,* 1995, (සංස්කරණය), රූපසිංහ, කරුණාදාස, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*වංසත්ථප්පකාසිනී,* 2001, අමරවංස නාහිමි, අකුරටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*සද්ධම්මප්පකාසිනී,* 1927, (සංස්කරණය), හේවාවිතාරණ, සයිමන්.

***Epigraphia Zeylanica,*** vol.I-V, Published of the Government of Ceylon.

**ද්විතීයික මූලාශ්‍රය**

ගමගේ, ගුණසේන, 2008, ***පැරණි හා මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය,*** සරස්වතී ප්‍රකාශන.

මනම්පේරි, පී., 1988, ***පුරාතන ලංකාවේ නීතිය හා අධිකරණය,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල හිමි, වල්පොළ, 1962, ***ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය,*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විද්‍යාලංකාර, අනුත්තරාදේවි, 2000, ***පැරණි ලක්දිව නීතිය හා අධිකරණය,*** පියසිරි මුද්‍රණය.

Perera, L.S., 2003, ***The Institutions of Ancient Ceylon From Inscriptions,*** vol.11, part 1.